ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

නීතිවේදී උපාධි පාඨමාලාව - 4 වන මට්ටම

අඛණ්ඩ ඇගයීම් පරීක්ෂණය 1 - 2006

ගිවිසුම් නීතිය - **LWU 2311**

කාලය - විනාඩි හතලිහයි.

---

දිනය - 2006.09.05 වේලාව - ප.ව.01.30 - ප.ව.02.10 දක්වා

---

*අපැහැදිලි අත් අකුරුවලට ලකුණු අඩු කරනු ලැබේ.*
*එක් ප්‍රශ්නයකට පමණක් පිළිතුරු සපයන්න.*

01. ' අර්පනයක හා සළකා බැලීමට කරනු ලබන ආරාධනා අතර වෙනස දැක්වීමට පාර්ශ්වකරුවන් විසින් භාවිතා කරන වචන ඒ නයින්ම අවසානාත්මක නොවේ.' ' අර්පනයක් ' යන්න සලකා බැලීමට කරනු ලබන ආරාධනයක් වියහැකිවාක් මෙන්ම, සලකා බැලීමට කරනු ලබන ආරාධනයක් ' අර්පනයක් විය හැකිය.'

අදහස් දක්වන්න. තීරණය කරන ලද නඩු තීන්දු හා අනෙකුත් සාක්ෂි ඇසුරින් ඔබගේ පිළිතුර තහවුරු කිරීම අපේක්ෂා කෙරේ.

02. 2006 අගෝස්තු 25 වන දින අරුණ තම කාරය රු : 5,00000/= කට විකිණීමට බියන්කාට ලිපියකින් අර්පනය කරයි. එදිනම බියන්කා අරුණට ලිපියකින් අර්පනය කරන්නේ ඔහුගේ කාරය එම මිලටම ගැනීමටයි. 2006 අගෝස්තු 31 වන දින අරුණගේ ලිපිය ලද බියන්කා එම කාරය මිලදී ගැනීමේ අපේක්ෂාවෙන් අරුණ හමුවීමට ගියද තම කාරය විකිණීම අරුණ ප්‍රතික්ෂේප කරයි.

බියන්කාට උපදෙස් දෙන්න.

බියන්කා 2006 අගෝස්තු 31 වන දින තම ප්‍රතිග්‍රහණය විදුලි පුවතකින් අරුණට දැන්වූයේ නම් ඔබගේ පිළිතුර වෙනස් වන්නේ ද?

\- හිමිකම් ඇවිරිණි. -